# ස.ණ.ස. පුවත් කොළඹින්

2019 - මැයි - පස්වන කලාපය

දායකත්වය රු 15/-











## සණස ව්‍යාපාරයේ ඉදිරි ගමන් මග


සමුපකාර ප්‍රසාදිනී ඩෑනිසන් වීරසූරිය
ස.ණ.ස. නායක

2019.04.05

මෙම කාරණය යටතේ 2019.02.27 දින පවත්වන ලද සාකච්ඡාවේ වාර්තාවක් මා වෙත ලැබීමෙන් පසුව මෙම නිවේදනය නිකුත් කරමි. සණස මහා සංගමය නමින් ලියාපදිංචුයේ සංගම්වල සාමාජිකත්වය ඇති ජාතික සංවිධානයක් ලෙසය. දැන් එම ලියාපදිංචි නාමය එම සංගමයට ඇතත් එය ස.ණ.ස. සමිතිවල මුදුන් මට්ටමේ ආයතනයක් නොවේ. එය සමිති සාමාජිකත්වය දරණ ද්විතීයික සංගමයක් බවට පත්ව තිබේ. මහා සංගමයේ වත්මන් සභාපතිවරයා ද කොමසාරිස්වරයකු ලෙස පත්වෙමින් සමුපකාරය පිළිබදව පරීක්ෂා කළ මහාචාර්ය ජේ.එම්. ගුණදාස මහතාගේ සභාපතිත්වයෙන් වු ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාවේ 3 වන පරිච්ඡේදයට අදාලව ඇති නිර්දේශ යටතේ වන 5 වැනි වගන්තිය ඔබගේ දැනගැනීම සදහා මෙහි පත දක්වමි. (වඩා හොඳ රටක් සදහා සමුපකාරය නම් පොත බලන්න)

''සියලුම ද්විතීයික හා තෘතීයික මට්ටමේ සමුපකාර පිලිවෙලින් සංගම් හා මහා සංගම් යනුවෙන් හැදින්විය යුතුය. මෙම සංවිධාන ව්‍යුහයේ තර්කාන්විත වර්ධනයක් වශයෙන් තෘතීයික හෝ ජාතික මට්ටමේ පෙඩරේෂණයක් (මහා සංගමයක) සාමාජිකත්වය සකස් විය යුත්තේ ද්විතීයික මට්ටමේ සංගම් වලින් එසේම ද්විතීයික සංගම්වල සාමාජිකයින් විය යුත්තේ ප්‍රාථමික සමුපකාර සමිතිය''

සෑම සමිතියක්ම ස්වාධීන මහජන සංවිධානයකි. මහා සංගම් මෙන් වසරකට වරක් නොව මාසිකවම සිය මහා සභා පවත්වනු ලබයි. එයද නියාමනයකි. සමිතියේ අතුරු ව්‍යවස්ථාව හා කාරක නියෝග යනු සමිති නියාමනය කරන නියමයන් වේ. ඒ අනුව කටයුතු කිරීම සදහා ද්විතීයික සංගම් මග පෙන්වනු ලැබේ. දැනුම ලබාදෙනු ඇත. කොළඹ සංගමය වසර 37ක් තිස්සේම එය මැනවින් සිදුකර ඇති අතර, සංගමයෙන් ලබාගත හැකි උපදේශාත්මක ග්‍රන්ථ ද නිකුත් කර ඇත. ඒ නිසා අත්වැල් බැඳගත යුත්තේ සාමාජිකත්වය දරණ ද්විතීක සංගමය සමගය. ජාතික සංගමයක් නම් ඒ සමග ඇත්වැල් බැදගත යුත්තේ ද්විතීක සංගම්ය. කොළඹ සංගමය දිස්ත්‍රික්කයේ මැනවින් ක්‍රියාත්මක වෙද්දී එම සංගමයේ කිසිදු එකගත්වයක් නැතිව කටයුතු කරන්නෝ සමුපකාර අතර සහයෝගය යන ප්‍රතිපදාවට ගරු නොකරන්නෝය. අද වන විට කෑගල්ල දිස්ත්‍රික් සංගමය කලාප දෙකක් පමණක් ඇති තිබූ ගොඩනැගිලි විකිණූ සංවිධානයකි. කුරුණෑගල යනු කලාප සංගම් 15ක් ඇති දිස්ත්‍රික්කයකි. මහා සංගමය පෙනී සිටිය යුත්තේ සංගම් ශක්තිමත් කිරීම මිස සමාගම් ශක්තිමත් කිරීම සදහා නොවන බව අමතක නොකළ යුතුය. සමාගම් ද එහි සමාජිකයෝය.

සණස යන නාමය අපට භාවිතා කිරීමට කිසිවෙකුගේ අවසරයක් අවශ්‍ය නොවේ. සකසුරුවම, ණයගනුදෙනු හා සමුපකාර යන වචනවල මුල් අකුරු භාවිතා කොට හැදින්විම මිස වෙනත් අයිතියක් මෙහි නැත. ඔබ සියලු දෙනාම එම වචන වල මුලකුරු බව දැන සමාජයටද එය දැනෙන ලෙස 'ස.ණ.ස.' යනුවෙන් භාවිතා කරන ලෙස මම ඉල්ලා සිටිමි. මහා සංගමයෙන් අනුමත කළ සමිතිවලට හැර වෙනත් සමිතිවලට නම භාවිතා කළ නොහැකි බව පුවත් පත්වල පළ ක්‍රිමට හැකිය. අප භාවිතාකරන ස.ණ.ස. නාමය තහනම් කිරීමට කිසිවකුටත් හැකියාවක් නැතිබව මෙයින් දන්වමි. සමිතිවල කොටස් වර්ධනය කිරීම හොදයි. කොළඹ දිසාවේ සමිති සංවර්ධනය කිරීම සදහා අප සංගමය වගකීම් දරමු. අප ඒ සදහා ශක්තිමත්ව සිටිමු. ඒ සදහා අධ්‍යාපනය පුහුණුව ලබා දෙමු. ග්‍රන්ථ නිකුත් කර තිබේ.

## 24 වන සංවත්සරය
### නැ. ඇරැව්වල අංක 02 සණස



ඇරැව්වල සිරි විජයසිරි වර්ධනාරාම විහාරස්ථානයේ පැවති සංවත්සර උත්සව සභාවේ මුලසුන ගරු පැවිදි අනුශාසක සහ විහාරාධිකාරී ගරු සේනපුර නන්දරතන ස්වාමීන් වහන්සේ විසින් හොබවන ලදී. ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ පර්ෂද සම්බන්ධීකරන ලේකම් කේ. චන්ද්‍රසිරි මහතා සහභාගි විය. 2018 වසර සදහා වු ප්‍රගති වාර්ථාව ඉදිරිපත් කරමින් ගරු ලේකම් සේනාරත්න මහතා 1994 අරම්භ වු මෙම සමිතිය වසර 23ක් තිස්සේ ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය නගා සිටුවීමට කටයුතු කළ බවත්, ප්‍රදේශයේ සමාජ සුභසාධක කටයුතු රාශියක් ඉටුකළ බවත් සදහන් කලේය.

06 පිටුවට...

## හෝමාගම කලාපීය කාන්තා වැඩමුළුව දා



හෝමාගම කලාපීය කාන්තා කමිටුව මගින් සංවිධානය කරනු ලබන කාන්තා වැඩසටහන් මාලාවේ 'පොල් කේක්' වර්ග සැකසීමේ පුහුණු වැඩසටහන පසුගියදා දියගම සමිතියේදී පවත්වන ලදී.

හෝමාගම කලාපයට අයත් සණස සමිති වල කාන්තා සාමාජිකාවන් මේ සදහා සහභාගි වූහ.

06 පිටුවට...

## පුවත් සපයන්නන් සදහා

'ස.ණ.ස. පුවත් කොළඹින්' ප්‍රකාශනයට ඔබේ නිර්මාණ, වාර්තා හෝ ඡායාරූප මෙන්ම චිත්‍ර ඉදිරිපත් කිරීමේදී, සමිතියේ ගරු සභාපති හෝ ගරු ලේකම් විසින් නිර්දේශ කර අනන්‍යතාවය තහවුරු කිරීම අනිවාර්‍යය වේ. සංගමයේ වාර්තාකරුවන් ලෙස ලියාපදිංචි නොවූ කිසිවෙකුත්, සමිතියේ අනුමැතිය නොමැතිව ලිපි ඉදිරිපත් කිරීමට උත්සුක නොවන්න.

සංස්කාරක මණ්ඩලය

## වෙසක් පැතුම්

වෙසක් සඳේ සඳකිරණින්
බුදුරැස් බබලන මොහොතේ
දයාබරව බුදුහිමි අපවෙත
නෙත් යොමනා කාලේ
අසිරි සිරිත් සිරි විඳ විඳ
අපි බුදුගුණ ගයනා කාලේ
නිවන් දොරටු විවර කරමු
සිත්සේ බොදු බැති සීලේ.




ප්‍රේමලතා වණිගසේකර
හෝ.කලාප අධ්‍යක්ෂිකා, මධ්‍යම කාන්තා කමිටු ලේකම්

# වෙසක් මල් මාසයයි

මාස දොලසින් වැදගත්වූත්, අසිරිමත්වූත් මාසය කුමක්දැයි කෙනෙක් විමසුවොත් බොහෝදෙනා ලබාදෙන පිළිතුර මැයි මාසය යන්නයි. හෙළ මාස ක්‍රමයට නම් කිරීමේදී මැයි මාසය වෙසක් මාසය ලෙස හඳුන්වයි. පොදු ව්‍යවහාරයේදී මල් මාසය යනුවෙන් හඳුන්වන්නේ බක්මහේ අසිරිය විඳ එලින් බරව පරිසරයේ තුරුලතා මෙන්ම මිනිසාගේ සිතුම් පැතුම් අළුත් අවුරුදු සංස්කෘතියෙන් ඔද වැඩී මල් මෙන් විකසිත වු හදවත් ඇති නිසාවෙනි.

ශ්‍රී ලංකීය බොදු ජනතාවගේ සිත් සැහැල්ලු වී බවුන් වඩන්නට, මෙත් කරුණාවෙන් උතුරා යන මාසය වෙසක් මාසයයි. එවන් මාසයක් ගැන යමක් ලියන්නට බුදුදහම අපට බොහෝ වස්තු බීජයන් එළිදක්වා ඇත. එසේනම් හරය හෙවත් අරටුව විසින් මිනිසාගේ දිවිපෙවතට බොහෝ බලපෑම් ඇති කරන බව අපි ප්‍රායෝගිකව දකිමු.

ගසක අරටුව, කඳෙහි අභ්‍යන්තර මැද කොටසෙහි පවතී. පරිසරයේ වැඩෙන ගස් අතර කෙසෙල්, ගස්ලබු, පුළුන්, මුරුංගා ගස් මෙන්ම මඩෙහි වැඩෙන පන් ගසෙහිද අරටුවක් දැකිය නොහැක. මෙම සරල සංසිද්ධිය, මිනිස් වර්ගයාට ආදේශකර බැලීමේදී, සමාජයේ ජීවත්වන කොටසක් අරටුව නැති ගස් ලෙසද, තවත් කොටසක් කොස්, මී, හල්මිල්ල, සඳුන්, කුඹුක්, මැහෝගනි, තේක්ක වැනි අරටුව සහිත ගස් මෙනැයි වෙන්කර ගත හැක. එවන් තත්වයක් සඳහා මිනුම්දණ්ඩ වන්නේ ක්‍රියාවයි. මිනිසාගේ සිතීම, හැසිරීම, හා කථාව මෙම ක්‍රියා සඳහා බලපාන බව පෙනීගොස් ඇත.

හරසුන් සැම දෙයක්ම බුදුදහම ප්‍රතික්ෂේප කරයි. ඊට බුදුහිමියන් පෙන්වා දුන් කරුණු අතර, භික්ෂූන් වහන්සේ වෙනුවෙන් රාජකතා, චොර කතා, මහාමාත්‍ය කතා, සේනාකතා, භය කතා, යුද්ධ කතා, අන්ත කතා, පාන කතා, ආදිය හරසුන් කථාවේ. එයින් වැලකී අල්පේච්ඡතා, සන්තුට්ඨිතා, විවේකතා, අසංසර්ගය, වීර්යය්‍ය, ශීලය, සමාධිය, ප්‍රඥාවය, විමුක්තියය, හා විමුක්තිඥාණ දර්ශනයය, යන කතා වල යෙදෙන ලෙස දක්වා ඇත. වටිනා කාලය අපතේ යා නොදිය යුතුය. එවන් දර්ශනයක් බුදුදහම කියාදෙයි. ජීවන මාර්ගයක් වු බුදුදහම තුළ සැහැල්ලුව, සැනසීම මොනවට ඉස්මතුව ඇත.

මජ්ඣිම නිකායේ මහා සාරොපම සුත්‍රයෙන් බුදුන්වහන්සේ පෙන්වා දුන්නේ ගසක ඇති සොභාවයි. බැලු බැල්මට ඕනෑම ගසක හරයක් නැතහොත් අරටුවක් දක්නට නැත. ගස අභ්‍යන්තරයෙහි ඇති හරය මතුපිටට නොපෙනේ. පිටතින් ලස්සන වු ගස් මෙන් මිනිසුන්ද වේ. අරටුවේ, හරයේ වටිනාකම වැඩිය. එම වටිනා කොටස දැකීමට පෙර ගසේ පොත්ත සුඹුල, එලය යන කොටස් අරටුව නොවන බව අපි දනිමු.

බුදු දහම විශාල වෘක්ෂයකි. එයින් සිසිලස සදයි. වියත් මග නොදකින මිනිසා ගසේ අතු, ඉති පොත්ත, සුඹුල වැළඳ ගෙන ඇත. ඒ හැම මිථ්‍යාව වේ. ලාභ, කීර්ති, ප්‍රසංශා ලබා ගැනීමේ අරමුණ ඒතුල තිබේ. එම මුලාවෙන් මිදී දොලොස් මහේ අසිරිමත් මාසය වු වෙසක් මාසයේදී, මුලාවෙන් මිදී සම්මා දිට්ඨියෙන් බලා ප්‍රඥාව හෙවත් විදර්ශනය වඩා ගනිමු.

හරය නොහොත් අරටුව සොයා යමු. ස.ණ.ස. ගමන් මග අල්පේච්ඡ ජීවිතයකට යොමු කර ඇත. එය නිවැරදිව වටහා ගනිමු. මල් මාසය වෙසක් සිරියෙන් පැහැපත් වෙද්දී මලෙක මෙලක හදවතින් දහම හරහා විඳ දැනගනිමු. සියළු සත්වයෝ නිදුක් නිරෝගීව සුවපත් වේවා යනුවෙන් ආශිර්වාද කර තෙරුවන් බෙලෙන් සෙත ශාන්තිය උදාකර ගනීවා යන්න කොළඹ ස.ණ.ස. පුවත් ප්‍රාර්ථනා කරයි.

**ස.ණ.ස. පුවත් කොළඹින්**

☆ **අධීක්ෂණය**
ඩී. වීරසුරිය
තුසිත් කුමාර වීරවර්ධන

☆ **ප්‍රකාශන කමිටුව**
සී. ගමගේ
එම්.ඩී. ජිනදාස
හේමසිරි බෙනරගම
එම්.රොහාන් ජේ. පෙරේරා
යු.ඩී.එස්. වීරසිංහ

☆ **විධායක සහාය**
නාලක ජයසුරිය

☆ **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
**220/1, හයිලෙවල් පාර, මහරගම.**
**දු.ක. 0112 851213, 0112 848801, 0114 301228**
sanasacolombo@gmail.lk

## නැදිමාල සණසින් ප්‍රජා සත්කාරයක්



කළුබෝවිල (ශික්ෂණ) රෝහලට ප්ලාස්ටික් පුටු 13 ප්‍රදානය කරන ලදී. එම අවස්ථාවට සම්බන්ධ වු රෝහල් අධ්‍යක්ෂකතුමා, රෝහල් කමිටු ලේකම්තුමා සහ නැදිමාල සණස සමිතියේ ගරු සභාපතිතුමා ඇතුළු කාරකසභික සාමාජිකයින් ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව

# වැඩිහිටියන් රැකගනිමු.





වැඩිහිටි ජනතාව ලෝකයේ බොහෝ දියුණු රටවලට සම්පතකි. ඔවුන් රැක ගැනීම සහ සුරක්ෂා කිරීම ජාතික වගකීමක් ලෙස සලකනු ලැබේ. වැඩිහිටියන් සඳහා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලැබේ. ඒවායේ වෛද්‍ය පහසුකම්, පුස්තකාල සේවා, ක්‍රීඩා හා විනෝද පහසුකම් පමණක් නොව විදේශ සංචාර පවා සලසා දෙනු ලැබේ. ජපානය, දකුණු කොරියාව වැනි රටවල වැඩිහිටි ප්‍රජාව එරටට බරක් නොවේ. එම රටවල ශ්‍රම හමුදාවට වඩා නූතන තාක්ෂණය යොදා ගනු ලබයි. සිංගප්පූරුව වැඩිහිටියන්ගේ සුභසාධනය ගැන විශේෂ සැලකිල්ලක් දක්වයි. සෑම පොදු ස්ථානයකම දුබලයන් සඳහා විශේෂයෙන් රෝදපුටු භාවිත කරන්නන් හට වෙන්වූ වැසිකිලි පහසුකම් සලසා ඇත. බස් රථයේ රියදුරු බිමට බැස රෝද පුටුවේ සිටින මගියා නංවාගෙන ධාවනය කළ යුතුය. සෑම විදුලි දුම්රියකම ඇතුළුවන දොරටු දෙපස ඇති ආසන වෙන්කර ඇත්තේ වැඩිහිටියන් සහ රෝද පුටු වලින් ගමන් යන ආබාධිතයන් වෙනුවෙනි.

ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනතාව සීඝ්‍ර වර්ධනයකට යොමු වුයේ 1980ට පසුවය. ඊට පෙර රටේ තිබු යුධ තත්වය නිසා බොහෝ වෘත්තිකයන් මෙන්ම ව්‍යාපාරිකයන්ද විදේශ කරා සංක්‍රමණය විය. රටේ සාමකාමී තත්වය උදා වීමත් සමග නැවත වර්ධනය සිදුවිය. වැඩිවන වැඩිහිටි පිරිස සඳහා රජයේ සුභසාධන සේවා වැඩි දියුණු කරන ලදී.

මෙයට පෙර වැඩිහිටි ස්ථාවර තැන්පත් සඳහා විශේෂ පොලී අනුපාතයක් හඳුන්වා දෙන ලදී. තවද ආදායම් බදු සීමා සඳහා සහනයක්ද ලබාදෙන ලදී. ජනමාධ්‍ය තොරතුරු අනුව අන්ත අසරණ දුක් විඳින වැඩිහිටියෝ සිටිති. මහපාරේ අතරමං කර දමන, සතුන් ලගින් කුඩුවල සිරකර තබන, වැඩිහිටියන් පිළිබඳ තොරතුරු හෙළිවේ. වැඩිහිටියන් අසරණ භාවයට දුක්ඛිත තත්වයට ඇද දමන සමාජ ක්‍රමය වෙනස් කිරීම රජයක වගකීමයි. මාසික විශ්‍රාම වැටුපක් ලබන වැඩිහිටියෙකු සඳහා යම් සුරක්ෂිත බවක් තිබේ. අර්ථසාධකය වැනි එකවර මුදලක් ලබාගන්නා වැඩිහිටියෙකුට එම මුදලින් දරුවෙකුගේ මගුල් උත්සවයක් පැවැත්වීම නිවසක් ඉදිකිරීම, වැනි කටයුත්තකට වියදම් කලාට පසු මුහුණ දීමට සිදුවන්නේ මහත් ආර්ථික දුෂ්කර තාවයකටය. කය වෙහෙසා ජීවත්වන ගොවියන්, කම්කරුවන්, වයස් ගතව දුබලවු විට ඇතිවන තත්වය තවත් කනගාටුදායකය. දරුවන් හෝ ඥාතීන්ගේ රැකවරණය නොලැබුනහොත් ඔවුන්ට සිදුවන්නේ මහ මගට වැටීමටය. බෝනොවන රෝග ව්‍යාප්තියේදී වයස අවුරුදු 40 ඉක්මවූ අයගේ ප්‍රමාණය වැඩිබව සඳහන්ය. රජයේ සෞඛ්‍ය සේවා නොමිලයේ ලැබුනද ඇතැම් බෙහෙත් වර්ග අධික මිල ගණන් වලට විකිණෙයි. සෞඛ්‍ය සේවය, ආහාර පාන, අධ්‍යාපනය, සහ සමාජ සේවා දියුණුව නිසා වැඩිහිටි ආයු ප්‍රමාණයේ වර්ධනයක් සිදුව ඇත. 2030 වසර වනවිට ශ්‍රම බලකාය ඉක්මවන වැඩිහිටි ජනගහනයක් වර්ධනය විය හැකිබව වාර්තාවේ.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2012 වසරේ පවත්වන ලද සමීක්ෂණයට අනුව දිවයින පුරා ලක්ෂ 25කට වැඩි වැඩිහිටි ජනගහනයක් ජීවත්වෙති. සමස්ත ජනගහනයෙන් එය 12.4%කි මොවුන් සඳහා රජයේ ලියාපදිංචි වැඩිහිටි නිවාස 306ක් ඇත. ඉන් 06ක් රජය යටතේ පාලනය වේ. මේවායේ 8355ක් පමණ රැකවරණය ලබති. අඩු ආදායම් ලාභි වයස අවුරුදු 70 පසු කළ වැඩිහිටියන් සඳහා රු 2000ක මාසික දීමනාවක් ගෙවීමට රජය සැලසුම් කර තිබුණි. මේ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ලියාපදිංචි සාමාජික ගනන 416,667 ක් බවට වාර්තාවේ. මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා පොරොත්තු ලේඛනයේ 101,317 ක් රැඳී සිටිති. ලක්ෂයකට වැඩි පිරිසක් කර කියා ගත හැකි දෙයක් නොමැතිව සිටිති. වැඩිහිටි නිවාස වල නේවාසිකව සිටින පිරිස රජය, සමාජ සේවා ආයතන, සහ පෞද්ගලික දානපතියන්ගෙන් යැපෙති.

**යු.ඩී.එස්. වීරසිංහ**
**නැ. ඇරැව්වල අංක 2 භාණ්ඩාගාරික, පර්ෂද ලේකම්**



# ස.ණ.ස.

පුවත් කොළඹින්






## "සාදු සාදු...සාදු"

මා මෙම ලිපිය ලියන්නට මුල පුරන විටම මගේ අතට ආවේ අනුරාධපුරයේ ජයශ්‍රී මහ බෝධීන් වහන්සේගේ වර්ණවත් ඡායාරූපයක්, රන් වැට මැද, රතු නොළුම් මල් වලින්, අටපිරිකර වලින් වන්දනීය බාවයට පත්වුනු ජයශ්‍රී බෝධීන් වහන්සේට නමස්කාර වේවා. සාදු.... සාදු.... අප මහ බුදුරජානන් වහන්සේගේ තෙමගුල සිහිකරන්නට මේ පින්බර වෙසඟ දිනය තරම් තවත් දිනයක් නැති තරම්. බොදුණුවන් වු අපට මේ මතයන් යලි මතක් කිරීමට අවශ්‍ය නැති තරම්. කලින් 'ගුඩ්මෝනිං' කියු අය ''බුදුසරණයි'' යනුවෙන් කියන්නට පුරුදුවීමම කොයි තරම් වටිනාකමක්ද කියා බලන්න. අපේ සිත ඒ වචනයෙන් කොයිතරම් සැහැල්ලු වනවාද? හදවතින්ම කරන එම ප්‍රාර්ථනාව ඔබට යහපතක්ම සිදුවෙනවාමයි. අපේ බස් රථවල රියදුරු මහත්වරුන් 'බුදුසරණයි' යන වැකිය නිරතුරුවම පෙනෙනා මානයක ගසා තිබෙනවා ඔබ දකින්නට ඇති. බසයේ යන එන දහස්දෙනා දිනපතා කියවනවාත් ඇති. ඒ අතර සමහර නරුමයන් 'බුදු සරණයි' වැකිය ගසාගෙන හොර හරක් ප්‍රවාහනය කරන අයුරුත් අපට අසන්නට ලැබේ. ඔවුනට එම කාර්ය කරන්නට ලැබෙන්නේ ටික කාලයක් පමණි. අනතුරකට පත්ව එම වාහනවලට සතුන්ට පෑගී මැරුන රියදුරු මහතුන් ගැන අපට අසන්නට ලැබෙනවා. හදිසි අනතුරු නිරතුරුවම දකින්නට ලැබෙන, ඒ අනතුරුවලින් මියයන ගණන වැඩි වෙමින් තිබෙන මෙම යුගයේ, මිනිසුන් වැඩියෙන් දහමට යොමුවීම ඒ බියකරු බව නිසාමයයි මට හිතෙනවා.

මෙවර වෙසක් වකවානුවේ අපට ඉතාමත් සැනසිලි දායක පණිවිඩ අසන්නට ලැබීම අපේ වාසනාවක්. මෙපමන කලක් රටම වනසමින් තිබූ මත් උවදුර නැතිකර ලන්නට රජය ගන්නා ලද එඩිතර පියවර ගැන අප ස්තුතිවන්ත වියි යුතුයි. ඒ නිසාම මත්ද්‍රව්‍යය කිලෝ ගනන් අල්ලාගන්නට පොලිසියටත්, ත්‍රිවිධ හමුදාවන්ටත් හැකි වුයේ අපේ ජනතාවගෙන් ලත් සහයෝගය නිසයි. අපේ දු දරුවන් මතින් බේරාගන්නට හැකි වීම ගැන, දෙමාපියනි ඔබට කොයිතරම් සතුටක්ද? එසේම මේ ක්‍රියා දාමයන් ගැන අප නිරතුරුවම ඇසගසා ගෙනම සිටිය යුතුයි.

අපේ ඇසට හසුනොවන තවත් පිරිසක් මේ කාර්යයන් සදහා ජීවිත තර්ජනද නොතකා කටයුතු කර තිබෙනවා. ඒ තමා ගමේ සිවිල් ආරකෂන කමිටුව. ග්‍රාම නිලධාරිතුමා හෝ ග්‍රාම නිලධාරිතුමිය සමග ජීවිත තර්ජනද නොතකා සිවිල් ආරකෂක කමිටු කරනා සේවයට අපේ ප්‍රණාමය පුදකල යුතුමය.

**ලක්‍ෂමන් ගුණවර්ධන**
**පිටිපන නගර වාර්තාකරු**

## තෙදින චාරිකාවක්

## තලංගම උතුර අංක 01 සණස

වන්දනාවට පාත්‍ර වුයේ රුවන්වැලි මහා සැයයි. දැඩි අව්රශ්මියේ වුවද මහසැරදුන් වටා ගියේ අපමණ සැදැහැ සිතිනි. අනතුරුව පුරාවිද්‍යා හා ස්වාභාවික රකෂිතයෙන් සමන්විත වු ඝන කැලෑවෙන් වටවු ගල්ලෙන් හා ගල් කුළුණු නටබුන් සොයා රිටිගල කන්ද ඓතිහාසික තොරතුරු සොයා ගිය ගමනේ මහා වෘකෂයන්, තුරුලතාවන් දැකිමද සතුටට කරුණක් විය.

අනතුරුව වෙල්ගම වෙහෙර වන්දනාව හා එහි ඓතිහාසික තොරතුරු ශිලා ලේඛන නටබුන් දැකබලා ගත්තෙමු. දෙවන දින ගෝකණ්ණ විහාරය සේරුවාවිල පුදබිම, දන්ත කුමරු හේමමාලා කුමරිය විසින් වැඩම කල ලංකාපටුන වැදපුදාගත් අතර පසුව පාසිකුඩා මුහුදු තීරයෙන් ජලස්නානය කරන ලදී. තෙවැනි දින සෝමාවති පුදබිම වන්දනා කිරීමෙන් පසු කාශ්‍යප රජුගේ රාජධානියවු සිගිරි ගල තරණ කලේ කැටපත් පවුර හා සිගිරි අප්සරුවන් දැකබලා ගැනිමෙන් අනතුරුවය.

සැදෑ අදුර අතරින් දැකබලා ගත් මොරගහ කන්ද ජලාශයෙන් චාරිකාව අවසන්විය. සතුට, විනෝදය, සාමුහික බව සමඟින් ගතකළ තෙදින චාරිකාවේ සාර්ථකත්වයට උරදුන් සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු සියලුම සාමාජික සාමාජිකාවන්ට විශේෂ ස්තුතිය පුද කරමි.

**වසන්ති කරවිටගේ**
**තලංගම උතුර අංක 01**
**වාර්තාකාරිණි**

## අවුරුදු ප්‍රාර්ථනා



| | |
|---|---|
| පුන් සඳින් ලොව නැහැවෙන | සඳ |
| වෙසක් සඳේසඳ කිරනින් සැනසෙන | අද |
| බොදු සිත් පහන් වන සැරසෙන | රට |
| ආඩම්බරයි අප ඉපදුන මේ රට | ගැන |
| ගැමුණු රජුන් යලි | බිහිවේවා |
| විහාර දේවිය යළි | හමුවේවා |
| දම්පල් හිමි යලි | පැමිනේවා |
| මඩිහේ හිමි සෝම සමිදු හිමි දක්නට | හැකිවේවා |
| සාමය සමගිය ලොව | රජවේවා |
| කුල මල භේදය නිති | දුරුවේවා |
| දුගියන් රජයන මග | දිස්වේවා |
| 'සිහළ - දෙමළ' අවුරුදු | සරු වේවා..... |

**ලක්‍ෂමන් ගුණවර්ධන**
**පිටිපන නගර වාර්තාකරු**

## සුරුවිරු මැතිඳුනි

### සුභ උපන්දිනයක් වේවා

නිබඳ මුවග හසරැලි මවාගෙන
තුන්කල්හිම බලා වැඩකටයුතු කරන
දැහැමින් සෙමින් නිති කල් ගත කරන
මැතිඳුනි ඔබට පතනෙමු සුවසෙත නිතින

මධ්‍යම කාන්තා කමිටුව වෙනුවෙන් සුභ පැතුම් ගෙන එන්නේ, හෝමාගම කලාප අධ්‍යක්‍ෂිකා මධ්‍යම කාන්තා කමිටු ලේකම් ප්‍රේමලතා වණිගසේකර

## මවුනි පියාණනි කරනෙමි උපහාර

| | |
|---|---|
| මිනිසත් බවට ජීවය දුන් | පියාණනි |
| මා දැඩි කරන්නට වෙහෙසුනු | පියාණනි |
| ඔබෙ සෙනෙහස මෙමට අහිමිව | පියාණනි |
| දහනම වසරක්ම ගෙවුනා | පියාණනි |
| සේවය කරන්නට මේ මුළු | සමාජෙට |
| තිරිසන් සතුන්ටත් මෙත් සිත | වඩන්නට |
| ඔබමයි මට කියා දුන්නේ අගේ | කොට |
| මම පිළිපදින්නෙමි මියයන | තුරාවට |
| දරුබර කරට ගෙන දුක් විදි පියා | මගේ |
| ඒ බර හිතුවෙ නෑ ඔබ මහමෙරක් | වගේ |
| වෙහෙසි දිවා රෑ අප රැක ගත්ත | අගේ |
| එනිසයි පියාණනි තවමත් බවය | අගේ |
| ඔබ මිය ගිහින් එකලොස් වසකට | පස්සේ |
| මව්තුමියත් ගියා ඔබ ගිය මග | ඔස්සේ |
| අමතක වුනේ නෑ සිහිවෙයි හැම | තිස්සේ |
| නෙතු අග තෙමෙනවා හෙමිහිට පොද | වැස්සේ |
| දසමස කුසදරා මා බිහිකල | අම්මේ |
| ඇග ගේ කිරි පොවා මා දැඩිකල | අම්මේ |
| වැටි වැටි නැගිටින්න මට අත දුන් | අම්මේ |
| දහඅට වසරක්ය ඔබ අහිමිව | අම්මේ |
| එකලොස් දෙනෙක් දරුවන් බිහිකල | අම්මා |
| මිහිකත වගේ ඒ බර ඉසිලු | අම්මා |
| යා යුතු මග මෙයයි පෙන්වා දුන් | අම්මා |
| ඒ පින් බෙලෙන් නිවනට යනු මැන | අම්මා |

**සෝමා දාබරේ**
**දෙවු සංගමයේ ලේකම් කරගම්පිටිය සණස**

## නැදිමාල සණසින්



නැදිමාල සණස සමිතිය මගින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන ගැබිනි මව්වරුන් සදහා පෝෂණ මල්ල ලබාදීම මෙවරද සිදුකරනු ලැබිණ. ඒ සදහා මව්වරු හත්දෙනෙකු සහභාගි වු අතර උපසභාපතිතුමා ඇතුළු කාරක සභිකයින් එම අවස්ථාවට සහභාගි වූහ.

**චාන්දනි පුෂ්පකුමාර - වාර්තාකාරිනී**

## ශ්‍රී ලංකාවේ සුන්දර ස්ථාන නරඹමු.

### ගාල්ල දිස්ත්‍රික්කය

මාදු ගඟ, හික්කඩුවේ කොරල් උයන, මඩොල් දූව, සීනිගම දේවාලය, උනවටුන මුහුදු වෙරළ, හිනිදුම කල්වාරි කන්ද, ගාලු කොටුව, පරගොඩ රජමහා විහාරය,

මෙම දිස්ත්‍රික්කයේදී විශේෂයෙන් දැකබලා ගත හැකිය. (පොතපත ඇසුරින්)

**එම්. රොහාන් ජේ. පෙරේරා**
**ප්‍රකාශන කමිටු නියෝජිත**

ස.ණ.ස.
පුවත් කොළඹින්



# සුහුරු කතක් සොඳුරු ලොවක්

අ ස්මාට් වුමන් ෆෝ අ බෙටර් වර්ල්ඩ්

මුලු ලොවම 1975 වර්ෂයේ සිට, ඇරඹූ ජාත්‍යන්තර කාන්තා දිනය සමරන බවත්, මතක් කරදී, සම්පත් කළමණාකරන සන්ධානයේ සභාපතිතුමන්ව, දේශකවරියක් ලෙස කටයුතු කල පද්මා කටුපිටිය මහත්මියත්, ප්‍රවීන මැහුම් උපදේශිකා ගීතාද සිල්වා මහත්මියත්, සියලුම කාන්තාවන් සහ නි. සාමාන්‍යාධිකාරි පද්මිණි ලියනආරච්චි ඇතුලව කාර්යාලයේ සියලුම සේවක සේවිකාවන් අද දිනයේ ගෞරවයෙන් පිළිගන්නා බව, මධ්‍යම කාන්තා කමිටුවේ ගරු සභාපතිනි ජයන්ති නවරත්න මෙනෙවිය පැවසුවාය.

මාලපල්ල සණස සමිතියේ චමිලා මහත්මියගේ නර්තනයෙන් අනතුරුව ඇරඹි උත්සවයේදී සමුපකාර ප්‍රසාදිනී කො. දිස්ත්‍රික් සණස සංගමයේ ගරු සභාපති ඩැනිසන් වීරසූරිය මහත්මා මෙම වැඩසටහන කො. දිස්ත්‍රික් ස.ණ.ස. සංගමයේ, කාන්තා කමිටු අධ්‍යක්ෂිකාවන් හා කාන්තා කමිටු නායිකාවන් සියලු දෙනාම දැනුවත් වීමට පැමිණ සිටින, 1984 වසරේ සිටම වැඩ රාශියක් අතරේ සිදුකරන එක් වැඩසටහනක් බව,

ශ්‍රී ලංකාවේ අතීතය දෙස බලනවිට අතීතයේ ගුණවත් නැණවත් දරුවන් පෝෂණය කිරීමත්, ඉතාමත් සරල ජීවිතයක් ගතකල බව දක්නට තිබුනි. ඉතාම සංකීර්ණ යුගයක ජීවත්වන බැවින්, පවුලේ ආදායමක් උපයා ගැනිමට කාන්තාවන්ට සිදුව ඇත. සකසුරුවම් හා ණය ගනුදෙනු සමිතිවල 60%ක් පමණ කාන්තාවන් සිටිනාමුත්, පුරුෂයන් ඉදිරියෙන් සිටිනා බවත්, කාන්තාවන් නියෝජනය වන්නේ ඉතා සුලු ප්‍රමාණයක් බවත්, එයට හේතුව විමසා බැලිය යුතු බවත්, ලංකාවේ ජනගහනයෙන් අඩක් පමණ සණස සමිතිවල යෙදී ඇත. සමිති 8700ක් පමණ ලියාපදිංචි වී ඇත. ඉන් 6700ක් පමණ ක්‍රියාත්මක වෙමින් පවතී, කාන්තා නියෝජනය වැඩිවන බවත්, එතුලින් නායකත්වය සකස්වී දක්ෂතා කුසලතා ඇති පිරිසක් බිහිවේවායි. එතුමා පැතීය.

ශ්‍රී ලංකා සමුපකාර මණ්ඩලයේ පලමු පත්වීම ලැබූ සම්බන්ධීකරණ නිළධාරිනියක් වශයෙන් කටයුතු අරඹා, කහගොල්ල සමුපකාර මණ්ඩලයේදී, අධ්‍යක්ෂ මහත්ම මහත්මීන් පුහුණුකර යෞවන කටයුතු අමාත්‍යංශයේ පුහුණු වැඩකටයුතු කර කුඩා කර්මාන්ත අමාත්‍යංශයේත්, සේවය කල පද්මා කටුපිටිය මැතිණිය,

අද වැනි වාසනාවන්ත දිනක, ඇගේ දැනුම ලබාදීමට ලැබීම ගැන සතුටුවන බව පැවසුවාය. ස්වාමියා ඉක්මවා යාමට නොව, පුරුෂාධිපත්‍ය දෙස බලා සිටිම පමණක් නොව, ආර්ථික වශයෙන් ස්වාධීනවීමට, ගෙදර සිට හෝ යමක් කල හැකිබව, 2030වන විට, කාන්තාවන් 100/100ක් ශක්තිමත් කාලීන සාමාජ ක්‍රමයට 50%ක් වත්, එසේ වුවහොත් ජයලබා ගන්නා බව. ජයලබා ගැනීමේදී උපකාරී වන කරුණු 14ක් ගැන, පැහැදිලි කරදෙන ලදී. මෙත්තා මුදිතා උපේක්ෂා වෙන් යුත් බුදු දහමක් පවත්නා අප රටේ, ප්‍රේම දඩයම සහ නොයෙකුත්, හඩ කවන ලද නාට්‍යය නොබලා රාවණා, කුසුමාසන දේවිය වැනි නාට්‍ය නැරඹීය යුතු බවත්, ඉතිහාසය රාවණා, යුගයෙන් පටන් ගත්බවත්, සැබෑ ඉතිහාසය දැනගත්විට රටක්, ජාතියක් ඉහලට ඔසවා තැබිය හැකිබව පවසන ලදී.

<u>සමුපකාරයේ දැක්ම,</u>

එකා සැමටත් සැම එකාටත් බව, සමුපකාර

<u>කාන්තාව යනු:</u> ගම වෙනුවෙන් සේවය කරන, උපදෙස් දියහැකි, නොමඟට යන අය සුමගට ගතහැකි, උපදෙස් දිය හැකි අය බව

සෑම කෙනෙකු තුලම යෝධයකු සිටී.

අභාග්‍ය නම් ඇතැමෙක් තමන්තුල, අගුටු මිට්ටෙකු හෝ සිටීයයි නොදැන්නියි එතුමිය පැවසුවාය.

<u>ප්‍රවීණ මැහුම් උපදේශිකා - ආචාර්ය ගීතාද සිල්වා මහත්මිය,</u>

කාන්තා පරපුර වෙනුවෙන් සතුටුවන බවත්, කාන්තාවක් වු නිසා කාන්තාවන්ට සේවය කිරීමට හැකියාව ලැබු බවත්, කාන්තාවන්ගේ දෑතට ශක්තිය ලබාදුන් බව එතුමිය පැවසුවාය. එතුමියගේ මවත් පියාත් නීතිගරුක අය බවත්, තමාගේ දරුවන් ගැන දෙමාපියන්, වගකිව යුතු බව, හොඳ පරපුරක්, සදාගත හොත් කිසිදිනක තනි නොවන බව පවසන ලදී.

කලාප බොහොමයක්ම නර්ථන, ගායනා, නාට්‍යය යනාදිය ඉදිරිපත් කරන ලදී.

**ප්‍රේමලතා වනිගසේකර**
**හෝමාගම කලාපයේ අධ්‍යක්ෂිකා,**
**මධ්‍යම කාන්තා කමිටු ලේකම්**

# සාමවිනිසුරු පදවියෙන් පිදුම් ලබයි.

සීමාසහිත දියගම සණස සමිතියේ ගරු සභාපති ධර්මසේන අමරතුංග මහතා මුළු දිවයිනටම බලපැවැත්වෙන පරිදි සාමවිනිසුරුවකු ලෙස පසුගියදා දිව්රුම් දෙන ලදී.

දියගම සණස සමිතිය ආරම්භයේ සිට මේ දක්වා වසර තිස්තුනකට අධික කාලයක් ගරු සභාපතිවරයා ලෙස මෙතුමා අඛණ්ඩව ජනතා සේවයේ යෙදී සිටී.



**චමිලා ජයතුංග**
**දියගම සණස ලේකම්**

# මිණිමුතුවන් සණස

සයුරෙන් නැඟෙන්නේ නිල් දිය රැළි නොවෙ ද?
සුළඟින් සැලෙන්නේ ගහ කොළ මල් නොවෙ ද?
සණසින් රැකෙන්නේ හොඳ ගුණදම් නොවෙ ද?
එමඟින් සැදෙන්නේ අපෙ රට දැය නොවෙද ?

ගලනා ගඟක දිය රැළි නැඟ නොවේ ද?
හමනා සුළඟ සිසිලස ගෙන නොවේ ද?
පිපෙනා කුසුම සුවඳක් ගෙන නොවේ ද?
පිබිදෙන සණස ගමකට පුරහඳ නොවේ ද?

එකමුතු වෙලා සැමදෙන අදහස් දෙනවා
කටයුතු සැමගෙ යහපතටම සසනවා
ගතයුතු තැනදි නිසි තීරණගෙන දෙනවා
මිණිමුතු වගේ සණසත් දැන් බැබලෙනවා

**එන්.එම්. සුනිල් නවරත්න - ඉහළ කොස්ගම සණස**

# ජාත්‍යන්තර කාන්තා දිනය සමරයි

නැ. ඉඳිබැද්ද ස.ණ.ස. සමිතියේ කාන්තා කමිටුවේ මෙහෙයවීමෙන් මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වනිතා සංවර්ධන නිලධාරි තුමියගේ මූලිකත්වයෙන් පසුගියදා සමිති රැස්වීම් ශාලාවේදී ජාත්‍යන්තර කාන්තා දින උත්සවය සිදු කරන ලදී.

සිවිල් ඉංජිනේරු විශ්ව විද්‍යාල බාහිර කථිකාචාර්ය ප්‍රියන්ත දයාරත්න මහතා සහ ලුනාව ආයුර්වේද රෝගලේ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය ඒකකයේ වෛද්‍ය එල්.අයි.ඒ.ද. සිල්වා, වෛද්‍ය එල්.ඩී. ලක්මාලි, වෛද්‍ය එල්.ආර්.ආර්. ප්‍රනාන්දු, වෛද්‍ය එම්.ඒ. දිලිනි චන්ද්‍රරත්න යන මහත්ම මහත්මීන් දේශණ සිදු කල අතර කාන්තාවක් ලෙස තමාගේ ජීවිතය ගැටළු වලින් තොරව කායික, මානසික, ශාරීරික සෞඛ්‍ය නිසි ආකාරයෙන් පවත්වාගත යුතු ආකාරය හා වාස්තු විද්‍යාව තුලින් සාර්ථක ජීවිතයට ලබාගත හැකි පිටුවහල පිළිබඳව දැනුවත් කරන ලදී.

**කේ.ජී.ඩී. මුදිතා ප්‍රියදර්ශනී**
**නැ. ඉඳිබැද්ද වාර්තාකාරිනි**

# හෝකන්දර ප්‍රගති සණස සමිතිය

## සංඝික දානමය පිංකම

සණස සමිතියේ මියගිය සාමාජිකයින්ට පිං අනුමෝදන් කිරීමටත්, වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයට, කාර්යමණ්ඩලයට හා සියළු සාමාජිකයිනට සේත පතා ස්වාමින් වහන්සේලා දහනමක් වැඩම කරවා පසුගියදා ද සාංඝික දානමය පිංකමක් සිදුකරන ලදී.



## වාර්ෂික චාරිකාව

වාර්ෂික චාරිකාව මෙවරත් තෙදිනක් පුරා යාපනය ප්‍රදේශය නැරඹීම සඳහා යොදා ගෙන තිබු අතර එහිදී තන්තිරිමලේ රජමහාවිහාරය, මඩු දේවස්ථානය, නාගදීප විහාරය, නල්ලූර් කෝවිල, යාපනේ කොටුව, යාපනේ පුස්ථකාලය, මන්නාරම, අලිමංකඩ යන ස්ථාන නැරඹූ අතර ඒ සඳහා සණස සමිතියේ සාමාජික සාමාජිකාවන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් මෙම චාරිකාවට එක්වූහ.



# කුඩා වුවත් නුවණැති හුනා

පැරැන්නෝ ගමනක ආරම්භයේදී හුනා ආවේනික ශබ්දය නැඟුවායැයි ගමන ප්‍රමාද කර ඇති බව අපි අසා ඇත්තෙමු. වසර පුරා පලාපල හා අවුරුදු සිරිත් සඳහන් ඈපා පංචාංග ලිතෙහි එක් කොනක සුහුණන් ඇඟ වැටුණු විට සුභ අසුභ දක්වන තීරයක් වෙන්කර ඇත.

කෙසේ වුවද 'හුනා' ප්‍රියමනාප සත්වයෙකු නොවේ. යමෙක් දුටු විගස දුවගොස් සැඟවෙන හුනා ප්‍රමාණයෙන් කුඩාය. එහෙත් ඌ රජ මාලිගාවේ බිත්තියට නැඟීමට උත්සාහ කිරීමට තීරණය කළ පසු කිසිවිටෙක එය නැවැත්වීමට අපහසුය. කිසිවෙක් විසින් ඌව මාළිගා බිත්තියට ඔසවා නොතබයි. ඌ එම බිත්තියටත් ඉන් නොනැවතී වහළයටත් නැඟ, එහි සිටින කෘමීන් කා දමයි. දැතින් අල්ලාගෙන රජමාළිගාවේ සිටින හුනා එදා මෙන් අදද දැකගැනීමට පුළුවන.

සණස සමිතිය වු අපිද අපගේ පිටස්තර පෙනුම හෝ හැකියාවන් දෙස බලා ජීවිතවල වටිනාකම තක්සේරු නොකරමු. හුනා තම ප්‍රතිවාදීන් විසින් අල්ලා ගැනීමට උත්සාහ කරද්දී වල්ගය කඩා දමා වේගවත් ගමනින් ගොස් තම ජීවිතය බේරාගන්නා සේ අපිද යම් අලාභයක්, හානියක්, කණගාටුවක් හෝ අනතුරක් ඇති වුණාත් එය අතැර දමා අනාගත ජයග්‍රහණ හා බලාපොරොත්තු කරා නිතර දිව යාමට උත්සාහ කරමු.

**තුසීමා අමරතුංග - හත්බෝධිය සණස**

# සමුපකාර සමාජයක් බිහිකිරීමට නම්, සමුපකාර සාමාජිකයාගේ කාර්‍ය්‍ය භාරය කුමක්ද?

පෙර කලාපය හා සබැඳේ.....

මේ අකාරයට අප සමුපකාරය පිළිබඳ විවිධ ක්‍රියාකාරකම් තේරුම් ගත යුතුව ඇත. ඕනෑම මානව ක්‍රියාවක් ආරම්භ වන්නේ එම ක්‍රියාවට හේතුවන කරුනු කාරනා ඇති නම් පමණි. එය එසේ නොවන විට මිනිසුන් ක්‍රියා කරන්නේ නැත. එනම් සෑම විටම ඕනෑම මිනිසකු ක්‍රියා කරන්නේ එය එකී මිනිසාගේ අවශ්‍යතාවක් හා වුවමනාවක් ඉටු කරන නිසාය. එනම් මිනිසාගේ අවශ්‍යතාවය හා බලාපොරොත්තුව විසින් මිනිසාව පෙළඹවීම කරන නිසාය.

මෙයට කියන්නේ උත්තේජන ප්‍රතිචාර න්‍යයය වශයෙන්ය. සමුපකාරය ඇති කිරීමට උත්තේජනයක් වශයෙන් සමාජ සුභ සාධනය භාවිතයට ගත හොත් එතැන සමුපකාරය බිහිවන්නේ සුභ සාධනය අරමුණු කරගෙන බිහිවන සංවිධාන වශයෙන්ය. එහෙත් උත්තේජන ප්‍රතිචාර න්‍යයය සමාජ සුභ සිද්ධිය වෙනුවෙන්, සමාජ සාධාරණත්වය වෙනුවෙන්, සමාජ අසමානතාය නැති කිරීම වෙනුවෙන්, සමාජ ප්‍රතිවිරෝධයන් නිෂේද කිරීම වෙනුවෙන් නම් එහිදී ආරම්භ වන්නේ සමාජ සේවය පදනම් කරගත් සමුපකාරය ව්‍යාපාරයක් නොව සමාජ ව්‍යවසායකත්වය පාදක කරගත් සමුපකාරය ව්‍යාපාරයකි.

මෙලෙස සමුපකාරය පිළිබඳ කියවීම ඇති අය සිටින්නේ නම් සමුපකාර ව්‍යාපාරය බිහිවන්නේ ආර්ථික ක්‍රමයක් වශයෙන්ය. ආර්ථික ක්‍රමයක් වශයෙන් බිහිවන ඕනෑම ක්‍රමයක් සමාජ ක්‍රමයක් බවට පත්වේ. එකී සමාජ ක්‍රමය ඊට අයත් දේපල ක්‍රමය මත පවත්වාගෙන යයි. මෙකී දේපල ක්‍රමය යනු ඕනෑම සමාජ ක්‍රමයක් පවත්වාගෙන යාමටත් එකී සමාජ ක්‍රමය වෙනස් කිරීමටත් සෘජුවම බලපාන තීරණ සාධකය වේ.

ඒ බව ලෝකයාට පලමුව පැහැදිලි කර දී ඇත්තේ ක්‍රි.පු. 563 දි භාරතීය දේශයෙන් උපන් සිද්ධාර්ථ ගෞතමයාණෝය. එකී ඉගැන්වීම් අනුව මිනිසා මිනිසාගේ සමාජ පැවැත්ම සකස් කර ගන්නේ නම් මුළු ගෝලිය ලෝකයම සමාජ අසාධාණයෙන් තොරවද, සමාජ අයුක්තියෙන් තොරවද, සමාජ අසමානතාවයෙන් තොරවද, සමාජ වගකීමෙන් යුක්තවද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙන් යුක්තවද, සැමට උපකාර කරන සමාජයක් වශයෙන් නැතිනම් සමුපකාර සමාජ ක්‍රමයක් වශයෙන් පවත්වා ගෙන යාමට අපට හැකිවේ.

අද ලෝකයේ කිසිම සමාජයක් තුල මෙකී සැමට උපකාර කරන සමාජ ක්‍රමයක් නැති බව පෙන්වා දිමට සිදුව ඇත. එහෙත් මිනිසුන් සැමට උපකාර කරන සමාජ ක්‍රමයක් වෙනුවෙන් ක්‍රියාකිරීම බොහෝ කාලයක සිට කරන කියන දෙයක් බවට පත්ව ඇත. ඒ සදහා දාර්ශනිකයින්, ආගමික නායකයින්, දේශපාලන නායකයින්, සිවිල් සමාජ නායකයින්, ගොවියන්, කම්කරුවන්, සොල්දාදුවන්, ගායකයින්, ගීත රචකයින්, ආදි වශයෙන් මෙකී නොකී බොහෝ දෙනා මේ සදහා කටයුතු කර ඇති බව පෙනෙනට තිබේ.

එහෙත් තවමත් එම සමාජය සොයා ගැනිමට හෝ බිහි කිරීමට හැකියාව ලැබි නැත. ඊට හේතුව කුමක්ද? එය මිනිසාගේ මෙලොව පැවැත්මෙන් විඥාණය තීරණය වන නිසාද? එසේත් නැතිනම් මිනිසාගේ සසර පැවැත්මෙන් විඥාණය තීරණය වන නිසාද? යන්න අප තේරුම් ගත යුතුව ඇත.

එහිදි විමසා බැලිය යුතු කරුන වන්නේ මේ සියල්ල තීරණය වන්නේ මිනිසා නැමැති සත්වයාගේ ක්‍රියාකාරකම් අනුව බවය. එහිදී මිනිසා කරන ක්‍රියා කොටස් පහක් යටතේ ක්‍රියාත්මක වි ඇති බව තේරුම් ගැනීමට සිදුවේ. මිනිසා එසේ ක්‍රියා නොකිරීමට මුළු ලෝකයේම මිනිසුන් තවමත් ආදී වාසී ජන සමාජයෙන් එහා කිසි දිනක ගමන් නොකරන පිරිසක් වී ඇති බවය.

ඇයි? අප එසේ කියන්නේ, එය වෙන කිසිවක් නිසා නොව දඹානේ ගණවර්ධනයන් කියවන ඕනෑම කෙනෙකුට අය අවබෝධ වන නිසාය. එනම් මිනිසාගේ පලමු වන ක්‍රියාව වන්නේ දැනුම, අවබෝධය සදහා ක්‍රියාත්මක විමය. මිනිසා විවිධ ක්‍රියා කිරීමෙන් එකී විවිධ ක්‍රියා පිළිබඳ ව්‍යවහාරික ඥාණය ලබා ගනී. එය සැබෑ ඥාණය නොවේ. ඒ සදහා දෙවනුව විද්‍යාත්ම පර්යේෂණ කරමින් ව්‍යවහාර ඥාණය විද්‍යාත්මක ඥාණය බවට පත්කර ගනී. එය මිනිසාගේ පළමු ක්‍රියාවේ දෙවන තලයට පත්වීමය. එතනින් නොනවතින මිනිසා මීලඟ සාක්ෂරතා ඥාණය සොයා පියාඹයි. එය ලබාගත් පසු එකී ඥාණයන්ගේ එකතුවෙන් යම් යම් දේ ගැන සොයා බලන විට එය නිවැරදි ඥාණයක් නොවන බව තේරුම් ගැනීමට පටන්ගනී. ඒ අනුව තවදුරටත් පිං කුෂල ගවේශිය නැතහොත් තම කුසලතා වර්ධනය කරමින් ඥාණය සොයා ගැනීමට නැතිනම් කිං සච්ච ගවේශීය යන ක්‍රියාවේ යෙදෙයි. අවසානයේ ඕනෑම දෙයක චතුරාර්‍ය්‍ය සත්‍යය සොයා ගනී. එය වු කලී ආර්ථක දුගීගමේ අනුලෝම ප්‍රතිලෝම අන්තර් සම්බන්ධතා පිළිබඳ අනාවරණ ඥාණය පහල වීමය.

එම ඥාණය පහල වු විට

1. දුප්පත් කමයනු කුමක්ද? 2. දුප්පත් කමට හේතුව යනු කුමක්ද? 3. දුප්පත් කම නැතිකරන්නේ කෙසේද? 4 දුප්පත් කම නැති කරන මාර්ගය කුමක්ද? යන සමුපකාර චතුරාර්‍ය සත්‍ය යනු කුමක්ද? යන්න අවබෝධ කරගනී. එය වු කලි වෙන කිසිවක් නොව සංස්ථාගත දුක පිළිබඳ කථාවවේ.

දැන් ප්‍රශ්ණ වන්නේ දුප්පත්කම නැති කිරීමට නම් එයට හේතුව කුමක්ද? යන්න අප තේරුම් ගත යුතුව ඇත. දුප්පත්කම අද ඊයේ ඇති වු දෙයක් නොවේ. එය ඉතිහාසයේ පැවති සමාජ ක්‍රමය වු ප්‍රාග්ගෝලීය සමුපකාර ප්‍රජාතන්ත්‍රවාදි සමාජ ක්‍රමය තුල පැවතුනේ නම් නැත. ඒ බව ලොවට පළමුව පැහැදිලි කර දුන් දයලෙක්තික දාර්ශනිකයා විඥාණවාදී දයලෙක්තික දාර්ශනිකයකු වු හෙගල් නම් නොවේ. එපමණක් නොවේ භෞතිකවාදී දයලෙක්තික දාර්ශනිකයකු වු කාල්මාක්ස්ද නම් නොවේ. එය පැහැදිලි කර ඇත්තේ විභජ්ජවාදී දයලෙක්තික දාර්ශනිකයකු වු සිද්ධාර්ථ ගෞතමයාණෝ විසින්ය.

අප එසේ කියන්නේ ඇයි? ලෝකයේ ආදර්ශමත් සමාජයක් බිහිකළ ආකෘතිය අධ්‍යයනය කිරීමෙන්ය. අග්ගඤ්ඤ සූත්‍රය, කූට දන්ත සූත්‍රය, චක්කවත්ති සිහනාද සූත්‍රය..... ආදී දේශනයන් කියවන ඕනෑම කෙනෙකුට එය අවබෝධ කර ගත හැකිය.

ඕනෑම සමාජ ක්‍රමයක පැවැත්මේ පදනම තිරණය වන්නේ ඊට අයත් දේපල ක්‍රමය තුල බව පැහැදිලි කරමින් සාංඝික දේපල පදනම් කරගෙන ලෝකයේ පළමු ආදර්ශමත් සමාජය වන සංඝ සමාජය බිහිකර ඇත. එකී සමාජය බිහිකර කියා සිටියේ කුමක්ද? මාගේ සංඝ සමාජය: සාංඝික දේපල ක්‍රමය තිබෙන තුරු පවතින අතර එම නිසාම එකී සමාජයේ ආර්ථික වශයෙන් දුප්පත් හාමුදුරුවන් හා දුප්පත් පන්සල් පමණක් නොව ආර්ථික වශයෙන් පොහොසත් හාමුදුරුවන් හා පොහොසත් පන්සල් වශයෙන් පංති පදනමින් නැතිනම් ආර්ථික අසමානතාවයෙන් යුත් පිරිසක් ඇති නොවන බවය.

එහෙත් යම් දිනක සාංඝික දේපල වෙනුවට පෞද්ගලික දේපල ඇති වුවහොත් මේ පංති භේදය ඇති වන බවය. අද මෙයට හේතුව කුමක්ද? පෞද්ගලික දේපල බිහි වීමය. (එනම් එංගලන්තයේ පෙර දිග වෙළඳ සමාගම මෙරටට පැමිණි ලන්දේසි වෙළඳ සමාගමේ දේශපාලන ආර්ථික බලය පැහැර ගත් පසු මුඩු බිම් පනතින්, විහාර හා දේවාල ගම් පනතත් ගෙන එනම් අපගේ මහ පොළව පෞද්ගලික දේපලක් බවට පත් කලේ එතෙක් භාවිත වටිනාකම මත පැවති ශ්‍රම වස්තුවට හුවමාරු වටිනාකමද ඊට එක් කරමින්ය. එය එංගලන්තයේ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරයෙන් කල කී දේ ලංකාවේ ආරම්භ කල ආකාරයවේ. මෙය අද වන විට මහ පොලව බෙදා ගැනීමේ උතුරේ හා දකුනේ පංති අරගලයට පාදක වි ඇති කථාව බව තේරුම් ගත යුතුව ඇත. මෙයද වෙනම කථාකල යුතුව ඇත.)


**සුරේන්ද්‍ර ඩී. බුලත්සිංහල**

**සමුපකාර ජන සමාජයක් බිහි කිරීමේ ජාතික ව්‍යාපාරයේ අධ්‍යාපන, පුහුණු හා ජනමාධ්‍ය ලේකම්**



**ඉතිරිය ලබන කලාපයට....**


## මාසික තිළිණය

ස.ණ.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

**සංස්කාරක මණ්ඩලය**

## කියවන්න... දැනුම ලබන්න....

### දෝතට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2019 ජුනි 15 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :-** **ජාත්‍යන්තර කම්කරු දිනය සැමරීමට නිර්දේශ කර ඇති දිනය හා මාසය නම් කරන්න?**

## කූපන් තරගයේ ජයග්‍රහණය

**කූපන අංක 03**

**සී.ස. මුල්ලේගම සණස සමිතියේ**
**ඒ. මැගිලින් අතුකෝරල මිය**

## කූපන් අංකය 05

මුලකුරු සමග නම: ..........................................................

ස්ථිර ලිපිනය: ..........................................................

..........................................................

දුරකථන අංකය: ..........................................................

පුරුදු අත්සන: ..........................................................

සණස සමිතියේ නම: ..........................................................

..........................................................

පිළිතුර: ..........................................................

..........................................................

# ස.ණ.ස.
පුවත් කොළඹින්

2019 මැයි කලාපය



01 පිටුවෙන්....

## 24 වන සංවත්සරය



2018 වර්ෂයේ ලාභ අලාභ ගිණුම සහ අයවැය වාර්තාව ඉදිරිපත් කළ භාණ්ඩාගාරික වීරසිංහ මහතා ණය මුදල් ලබාදීම වර්ධනය වී ඇති බව පෙන්වා දුන්නේය. චන්ද්‍රසිරි මහතා සිය දේශනය කරමින් මෙම සමිතිය ආරම්භයේ පටන් තමා හොඳින් දන්නා බවත්, විහාරස්ථානය මුල්කරගත් යහපත් ස්වෙච්ඡා නිලධාරීන් පිරිසකගේ කැපවීමෙන්, සමිතිය සංවර්ධනය වු බවත් සදහන් කලේය. තවද දිස්ත්‍රික් සංගමයේ පැවැත්වෙන පුහුණු පාඨමාලා සදහා සහභාගිවීමෙන්ද, පර්ෂද රැස්වීම් සදහා නොකඩවා සහභාගි වීමෙන්ද, වත්මන් කාරක සභාව දක්වන උනන්දුව ගැන තමා සතුටුවන බවද ප්‍රකාශ කලේය.

<u>නව නිලධාරි මඩුල්ල</u>

ගරු සභාපති : කුසුමලතා සමරවික්‍රම
ගරු උපසභාපති : ධම්මිකා මානෙල් පතිරණ
ගරු ලේකම් : ජී.පී. සේනාරත්න
ගරු භාණ්ඩාගාරික : යු.ඩී.එස්. වීරසිංහ
ගරු කාරක සභික : රේණුකා දමයන්ති, ඉන්දික නිරෝෂන්, කේ.ඒ.එච්. සේනාරත්න, උදය කුමාර, සදුනි කල්පනා රත්නායක

01 පිටුවෙන්....

## හෝමාගම කලාපීය කාන්තා වැඩමුළුව දා

කොළඹ දිස්ත්‍රික් මධ්‍යම කාන්තා කමිටු ලේකම් ප්‍රේමලතා වනිගසේකර, දියගම පර්ෂද සම්බන්ධීකරණ ලේකම් නිර්මදා ජිනාදරී, හෝමාගම පර්ෂද ලේකම් ප්‍රියංගා කුමුදුනී යන මහත්මීන්ගේ සහභාගිත්වය දැරූ අතර, සම්පත් දායකත්වය ලබාදෙන ලද්දේ ප්‍රවීන සුපවේදිනී ගයනි හපුආරච්චි මහත්මිය විසිනි.

මෙම පුහුණු වැඩසටහන සදහා අනුග්‍රහය දියගම සණස සමිතිය මගින් ලබාදුනි.

**චමිලා ජයතුංග - දියගම ලේකම්**

## ජාතක කතා පොතෙන්
# සුජාතා ජාතකය

| | |
|---|---|
| දෙසුසම් අමාවකි අරමේ | ජේතවනේ |
| නැගණිය විශාඛාවනි පෙරමුණට | ගෙනේ |
| නාමය සුජාතාවන් වී ඔකඳ | වුනේ |
| පසිඳුව විසුවමුත් ඔවදන් ඇවැසි | වුනේ |
| පෙර බරණැසෙහි බඹදත් රජුරජ | කරනා |
| එම රජු පුත්ව බෝසත් ඉපදුනි | පිනෙනා |
| රජතුම ඇවෑමෙන් කුමරුන් සිහසුන | අරනා |
| තම මැණියන් දුර්ගුණ විමසුම් | කරනා |
| හික්මීමක් නොමැත, දැසි දස්නට | බණිනා |
| අවවාදයක් දෙන්නට රජු කල් | මරනා |
| අරමුණ මෑණියන් වේ. උයනට | පැමිනා |
| අතරතුරෙහි කිරලෙකු නද දෙයි | සැනිනා |
| පිරිසේ සියළු දෙන කන්පත් වසා | ගෙන |
| පරුස වදන් අමිහිරි නද නුරුස | මින |
| ගෝසා කළේ නවතන්නට කිරල | සන |
| කොවුලකු ගසයි ගීයක් එම උයන් | කොන |
| සේවක පිරිස සතුටින් හඬ සවන් | ගෙන |
| පිය වදනින්, බස මිහිරින් ගයනු | මැන |
| එම අදහසින්, මව් බිසවගෙ නුගුන | ගැන |
| අවවාදයෙන් පහකරවයි කිලිටි | මන |
| ඇඳුමෙන් පැළඳුමෙන් විසිතුරු වී | සිටියත් |
| රළුබස් දෙඩුම දොලොවට | පාපය ගෙනයත් |
| පාටින් කළුව කොවුලා දැකුමට | නොමයත් |
| එනමුත් මිහිරිහඬ සණසයි මනු | හදවත් |

*උපදේශය: ශරීරයේ ප්‍රමාණයට වඩා, වචනයේ බලය, ජනප්‍රිය වීමට උපකාරවේ.*

*-සිරි-*



## ජ්‍යේෂ්ඨ ගණකාධිකාරීවරයෙකු මෙන්ම භාණ්ඩාගාරියේ මුදල් අධ්‍යක්‍ෂත්වරයකු වු
# සංගමයේ සභාපතිගෙන්

### ප්‍රශ්න විමසා පිලිතුරු ලබා ගන්න.

**ප්‍රශ්ණය** : සමිතිය සතුදේපළක් විකිණීමෙන් හෝ ප්‍රත්‍යාගණනය කිරීමෙන් වන අතිරික්තය වර්ෂයේ ආදායම් ලෙසට ලාභාලාභ ගිණුමට ගත යුතුද?

**පිලිතුර** : සමිතිය සතුදෙපළක් අලෙවි කිරීමෙන් හෝ නැවත ප්‍රත්‍යගණනය කිරීමෙන් හෝ අතිරික්තයක් ඇති වන්නේ නම් එම අතිරික්තය ප්‍රාග්ධන සංචිතයක්ම වන්නේය. ඒ නිසා එවැනි ලාභ හෝ අතිරික්තයන් වර්ෂයේ ආදායම් වියදම් ගිණුමට බැර නොකළ යුතුය. මෙම අතිරික්ත ප්‍රාග්ධන සංචිතයක් ලෙස පවත්වා ගත යුතු අතර ලාභ වශයෙන් බෙදිය නොහැකිය. සමුපකාර සමිති ගිනුම් කරණය සදහා වු ගිණුම් කරන ප්‍රමිත අත්පොත මගින් නියමිත උපදේශය මෙයම වේ.

**ප්‍රශ්ණය** : සමිතිවලට රැස්වෙන මුදල් රජයේ බැංකුවලම තැන්පත් කළ යුතුයැයි රජයේ නිලධාරින්ට නීතියෙන් නියම කළ හැකිද?

**පිළිතුර** : එහි අරමුණ මුදලේ සුරක්‍ෂිත බව නම් සෑම පුරවැසියෙකුගේම මුදලේ සුරක්‍ෂිත බව රැකීම රජය වෙනුවෙන් මහ බැංකුවේ වගකීම වන බැවින්, මහ බැංකුව කළ යුත්තේ රජයේ බැංකු හැර වෙනත් බැංකු හෝ මුල්‍ය ආයතන පවත්වාගෙන යාමට අවසර නොදීමය. මහ බැංකුවේ අවසරය ලත් බැංකුවල මුදල් තැන්පත් නොකළ යුතුයැයි යමෙකු නියම කරන්නේ නම් එය මහ බැංකුවේ අධිපතිතුමාගේ බලය අභිබවා යාමකි.

**ප්‍රශ්ණය** : සංගමයේ මුදල් තැන්පත් නොකළ යුතුයැයි සාමාජික සමිතියකට නියම කිරීමේ නීති පැනවිය හැකිද?

**පිලිතුර** : එවැනි නීති බලරහිත නීතිවේ. කුමක් නිසාද සංගමයක් ලියාපදිංචි කරන්නේ සාමාජිකයින්ගේ තැන්පත් රැස්කිරීම සදහා බලය ඇතිවය. පුද්ගල සාමාජියකුට සිය සමිතියේ මුදල් තැන්පත් කිරීම නොකල යුතුයයි නියම කිරීමට නීති පනවන්නේ නම් කළ යුත්තේ සමිති ලියාපදිංචි කිරීමෙන් වැළකී සිටිමය. සාමාජිකයකු තමන්ගේ සමිතියේ මුදල් තැන්පත් කිරීමට වෙනත් කිසිවෙකුගේ අවසරයක් අවශ්‍ය වන්නේ නැතිසේම, එය නොකළ යුතුයැයි නියම කිරීම ද නීතියටත් සදාචාරයටත් සමුපකාර සංවර්ධනටත් පටහැනිය.

**ප්‍රශ්ණය** : සමිතියකට ණය මුදලක් හෝ පොලියක් ගෙවීම අතපසු කර ඇති සාමාජිකයකුට කාරක සභිකයකු ලෙස පත්විය හැකිද?

**පිලිතුර** : සමුපකාර රීතිමාලවේ 21(1) හි දැක්වෙන කාරක සභාවට පත්වීමට ඇති නුසුදුසු කම් දක්වෙන වගන්තිය මෙසේය.

'21 (1) (ඉ) සමිතියට හෝ වෙනත් ලියාපදිංචි කළ සමිතියකට හෝ ඈවරකරුවෙකුට හෝ ගෙවිය යුතු මුදලක් ගෙවීම, තුන් මාසයකට අධික කාලයක් පැහැර හැර ඇති කෙනෙක්

මේ නියමය අනුව යම් සාමාජිකයකු කාරක සභාවට පත්කරගන්න අවස්ථාව වන විට ඉහත පරිදි සමිතියට ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම මාස තුනකට වඩා වැඩි කාලයක් අතපසු කර ඇති අයෙකුට කාරක සභාවට පත්විම නීත්‍යනුකූල නොවේ. එසේම ස.ණ.ස. සමිතියේ අතුරු ව්‍යවස්ථාවේ 4.2 හි කාරක සභිකත්වය අහිමිවීම යටතේ දැක්වෙන වගන්තිය මෙසේය.

'4.2.1(එ) තමන් විසින් මිලයට ගැනීමට ගිවිසගත් කොටස්වල වාරික හෝ ලබාගත් ණය මුදලේ වාරික ගෙවීම් මාස 3 කට වඩා කල්පසු කිරීම'

මේ අනුව කාරක සභික ධුරය දරමින් සිටින අයෙකු සමිතියට ගෙවිය යුතු යම් වාරික ගෙවීමක් මාස 3 කට වඩා කල්පසු කර ඇත්නම් එම ධුරය ඉබේම අහිමිවනු ඇත.

# සුභ උපන්දිනයක් වේවා !!

**කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය**


යලිතා ප්‍රනාන්දු


එච්. ප්‍රනාන්දු


එල්. මුහන්දිරම්


ජී. කැතරින්


වී. ප්‍රනාන්දු


ජ්.ඩබ්. නිමලාවති


සුසිලා රංජනි


අයි. ප්‍රනාන්දු


යමුනා ශිරන්ති


එච්.ආර්. මැගිලින්


එම්. වික්‍රමරත්න


ඒ. ජයන්ති


ශ්‍රදානා හේවාවසම්


ඩී.එම්. චන්ද්‍රසේන


එල්.සී. ප්‍රනාන්දු


අමල් ධනුෂ්ක


නිෂාදි ප්‍රසාදිකා


අවන්ති දර්ශනි


චම්පිකා නිලංගනි

## 38 වන වසරට පා තබන

# කරගම්පිටිය කවුඩාන සණස සමිතිය

අප සමිතිය 38 වැනි වසරට පා තබන්නේ බලප්‍රදේශයේ පවුල්වල ජීවන තත්වය උසස් කිරීම සඳහා අවශ්‍යවන මූලධනය සම්පාදනය කිරීමෙන් පමණක් නොව සමාජයීය අවශ්‍යතාවන් ඉටු කිරීමේ ප්‍රමුඛයා ද වෙමිනි.

ගරු සභාපති සමූපකාර ප්‍රසාදිනි ඩැනිසන් වීරසූරිය මහතාගේ මග පෙන්වීම යටතේ මෙම සමිතිය 1981 ඔක්තෝම්බර් මස 08 දින ආරම්භ කොට එතුමාගේ නායකත්වය යටතේ වසරින් වසර 2018 වසර අවසානය වන විට වසර 37 පුරාවට අපමණ මෙහෙයක් ඉටු කොට ඇත අප සමිතිය කොළඹ දිස්ත්‍රික්කයේ කාර්ය සාධන ඇගයීමේදි සෑම වර්ෂ වලදිම ප්‍රමුඛ උපහාරයට ලක්වීම දිස්ත්‍රික්කයේ සමිති අතර උසස් ක්‍රියාකාරීත්වයක් තිබූ බවට සාධකයක් වේ.

ප්‍රධාන විධායක නිළධාරියා ලෙස කාර්යය මණ්ඩලය මෙහෙයවීමත් ලේකම්වරයා ලෙස අධ්‍යක්ෂක මණ්ඩලයට තීරණ ගැනිම සදහා මාණ්ඩලික වාර්තාව හා කළමණාකරණ වාර්තාව ලබා දෙමින් සමිතියේ කළමණාකරණ කාර්යක්‍ෂමතාවය දියුණු කිරීමටත් මාසික ආදායම් හා වියදම් ප්‍රකාශය හා ප්‍රමිතින් සමාලෝචනය සදහා ඉඩ ලබා දීමට හැකිවීමෙන් සමිතියේ කටයුතු විනිවිද බවට පත්වීම මෙන්ම නිවැරදි තීරණ ගැනිමට වඩාත් හේතු විය.

## සාමාජිකත්වය

අප සමිතියේ සම්භාවනිය ,පූර්ණ,අයදුම්කාර හා ආශ්‍රිත වශයෙන් සිටින මුළු සාමාජික සංඛ්‍යාව 3675 කි. වර්ෂය තුල 29 දෙනෙකුට සම්භාවනීය සාමාජිකත්වය පිරිනැමීමෙන් හා හත්දෙනකු ඉවත්වූ බැවින් ද 2018.12.31 දිනය වනවිට මුළු ගණන 234 ක් වන අතර, 2018 වර්ෂය අවසන් වන විට පූර්ණ සාමාජිකත්වය 644 කි. වර්ෂය තුල නව සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කල අය අතරින් 60 දෙනෙකු සඳහා මාස 03ක් තුල දින 03 කදී පැය 06 ක් තුල සමුපකාර නීතිය අතුරු ව්‍යවස්ථාව හා කාරක නියෝග පිළිබඳව දැනුමක් ලබා දෙන ලදී. අප සමිතිය සමග ගනුදෙනු කිරීම සදහා එකගත්වයකට එළඹෙන ඉහත සාමාජික ගණයන්ට නොවැටෙන අනිකුත් සියලු ගනුදෙනු කරුවන් ආශ්‍රිත සාමාජිකයින් ලෙස පිළිගනී. එම ප්‍රමාණය 2735 ක් වේ.

## සමාජයීය සේවා

පහත සදහන් කෙරෙන පරිදි සාමාජයිය, සංස්කෘතික හා අධ්‍යාපන කටයුතු ඇතුලත්ව වර්ෂය පුරා දරා ඇති පිරිවැය රුපියල් ලක්ෂ 40 ක් පමණ වේ. එය පහත සදහන් පරිදි වේ.

1 සාමාජිකත්වය දරා වසර 30 ක් හා වයස අවුරුදු 60 ඉක්මවු සාමාජිකයින් සදහා මාසිකව රුපියල් 2000.00 බැගින් වැඩිහිටි දීමනාව ලබමින් සිටියදී අභාවයට පත් වූ හත්දෙනෙකු හා සාමාජිකත්වය අහිමි වූ දෙදෙනෙකු වෙනුවෙන් ගෙවා ඇති දීමනාව රුපියල් 407,000/- නිසා මේ වෙනුවෙන් දරා ඇති මුළු වියදම රුපියල් 2,560,000/- වී ඇත. 2018 වසරේ ගෙවා ඇති මුදල රුපියල් 843,000/-ක් වේ.

2 වැඩිහිටි දිනය යෙදෙන ඔක්තෝබර් 01 දින අප සමිති ශාලාවට දෙටු සාමාජිකයින් හා කලත්‍රයින් සියලු දෙනා කැදවා දවසම සුහදව ගත කිරීම සදහාත්, විවිධ දක්ෂතාවයන් ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලබා දුනි. මෙම අවස්ථාවට පැමිණි පිරිසට දිවා ආහාරය ඇතුලුව තෑගි ද ප්‍රදානය කළ අතර ඒ සදහා රුපියල් 128,264.00 ක් දරණ ලදී. වයස 60 ඉක්මවා ඇති අය අතරින් වයෝවෘද්ධත්වය අනුව වාර්ෂිකව තෝරා මුදල් පරිත්‍යාගය ලබාගත් සංඛ්‍යාව මේ වන විට 175කි. හයවන වරට දෙටු සුහද හමුවේ දී මුදල් ත්‍යාගයන් එක් අයෙකුට රුපියල් 2,500.00 බැගින් 19 දෙනෙකුට පිරිනමන ලදී

3 මෙම වර්ෂය තුල සුභසාධනය යටතේ අවමංගල්‍ය ආධාර, ආහාර පාන සැපයිම, අසනීප ආධාර, විවාහ ආධාර, පෝෂණ දීමනාව, ළමා උපත් හා සිවුදරු උපත් දීමනාව ද, අවුරුදු උදාව සාමාජික ප්‍රබෝධන, පුවත්පත් හා කාරක නියෝග පැන විසදුම් සදහා රුපියල් දොලොස් ලක්‍ෂ දහසය දහස් අටසිය හැට හතක 1,216,867/- මුදලක් වැය කර ඇත .

4 මහරගම පමුණුව පාරේ ළමා නිවාසයේ දරුවන් වෙනුවෙන් දිවා ආහාරය පිරිනැමීම වාර්ෂිකව සිදුකරනු ලබන හැදල ලාදුරු රෝහලේ නේවාසිකයින් සදහා දිවා ආහාරයත් සියලු දෙනා සදහා ත්‍යාග පිරිනැමීම මාසයකට දෙවරක් වන පරිදි වර්ෂය පුරාම ආයුර්වේද සායන 24ක් පැවත්වීම මාලිගාවත්ත වකුගඩු රෝහලේ සායනික රෝගින් වෙනුවෙන් සංග්‍රහ කිරීම හදවත් හා රුධිරවාහිනි ආශ්‍රිත රෝග අවධානම අඩු කිරීම සදහා වෛද්‍ය පරීක්‍ෂණ නොමිලයේ සිදු කිරීම හා දකුණු කොළඹ ශික්‍ෂණ රෝහලේ අංක 09 කාන්තා වාට්ටුව තීන්ත ගා පිළිසකර කොට වාර්ෂිකව නඩත්තු කටයුතු සමිතිය මගින් සිදු කිරීම සදහා රුපියල් එක් ලක්‍ෂ හැට අට දාහස් දෙසිය අනු අටක මුදලක් වැය කර ඇත

5 මංගලාරාම දහම් පාසල, චතු මධුර වෙසක් කළාපය, සමනල සෑදැව, ශාස්ත්‍රානන්ද නවෝද්‍යා පාසලේ ක්‍රිකට් තරගය, කතරගම අසුහාරදාහ පහන් පිංකම වෙනුවෙන් හා සණස සහන යටතේ දෙදෙනෙකු වෙනුවෙන් පරිත්‍යාගයන් සිදු කිරීම යන කටයුතු වෙනුවෙන් රුපියල් අසුහත් දාහස් අටසියයක් වැයකර ඇත.

6 සාමාජික මහත්ම මහත්මියන්ගේ උපන් දින සුභපැතුම් සණස පුවත්පතේ පළ කිරීම සදහා රුපියල් 10,700.00 වැය කරන ලදී.

7 මාසිකව ළමා සමාජ රැස්වීමට පැමිණි සෑම දරුවකුටම පාසල් උපකරණ සරසවි පොත් අලෙවි සැල් වලින් ලබා ගැනීම සදහා මෙම වර්ෂයේ ද එක් අයකුට රු 1,300.00 බැගින් වූ වවුචර් පත් ලබා දීම පළමු කාර්තුවේ දී ළමා තැන්පත් රු. 500.00 ක් හෝ ඊට වැඩියෙන් තැන්පත් කළ දරුවන් වෙනුවෙන් රු. 500.00 බැගින් වූ සරසවි පොත් අලෙවිසැල් වලින් පාසල් උපකරණ ලබා ගැනීම සදහා වවුචර් පිරි නැමීම. අවසන් වාර පරීක්ෂණයෙන් 1:(8), 2:(1), 3:(4) ස්ථාන හා 60% (53) කට වැඩියෙන් ලකුණු ලබාගත් දරුවන්ට මුදලින් ආධාර දීම. පහ වසර ශිෂ්‍යත්වාධාර දීම උසස් පෙල ආධාර විශ්ව විද්‍යාල ආධාර එක් දිනක ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ ළමා නත්තල් සාදය පැවත්වීම ආදි කටයුතු සදහා දරන ලද මුලු වියදම රුපියල් පන් ලක්‍ෂ හතලිස් එක් දාහස් අනු හතරක් විය.

8 2007 වර්ෂයේදි ආරම්භ කරන ලද පුස්තකාලය 2018 වර්ෂය අවසන් වන විට සාමාජික සංඛ්‍යාව 458 ක් වන අතර පොත් 5935 ක් සතුව පවතින අතර සාහිත්‍ය මාසය තුල රුපියල් 75000 ක පොත් මිලට ගැනිම හා පරිත්‍යාග ශිලින්ගෙන් ලද පොත් ප්‍රමාණය අනුව වර්ධනය වේ පොත් බැහැරට ගෙන යාම සදහාත් ළමුන් සදහා අධ්‍යාපන කටයුතු කිරීම සදහා පහසුකම් සලසා ඇත.

9 මෙම වසරේ ද කාන්තා කමිටුව මෙහෙයවීමෙන් කිරි මව්වරුන්ගේ දානමය පිංකම, ළමා සාහිත්‍ය තරග පැවත්වීම, බැති ගී සංදර්ශණය පැවත්වීම හා ළමා සමාජයේ කටයුතු පිළිබදව භාරව සිටිම.

10 තරුණ කමිටුව මෙහෙයවීමෙන් රිදි තාරකා 7 විවිධ ප්‍රසංගය පැවත්විම, පිරිත් පිංකම් හා දානමය පිංකම් පැවත්විම, අයිස් ක්‍රීම් දන්සලක් පැවත්විම, කමිටු සුහද හමුව පැවත්විම ආදි කටයුතු සිදු කරන ලදි.

11 සාමාජික සාමාජිකාවන් ඇතුලු 17 දෙනෙකු සමග දින 11 ක දඹදිව වන්දනා චාරිකාවක් නොවැම්බර් මාසයේ දී සිදු කළ අතර, සාමාජිකයකු සදහා රුපියල් 125,000 ක පොලී රහිත ණය මුදලක් ලබා දෙන ලදී. මසකට රුපියල් 4000/- බැගින් ගෙවීමට නියමිතය. ලෝටස් ආයතනය සමග වාර්ෂිකව සැප්තැම්බර් මස දඹදිව චාරිකා සිදු කිරීමට අපේක්ෂිතය.

12 මාසිකව පැවැත්වූ දහම් දෙසුම් සදහා අප කෙරෙහි කරුණාවෙන් වැඩම කල හිමිපාණන් වහන්සේලා සදහා සමිතියෙන් පිරිකර පූජා කිරීම සදහා දරණ ලද වියදම රුපියල් 50,000 ක් වූ අතර දායකත්වය දුන් අය දැරූ වියදම අනුව මුළු පිරිවැය රුපියල් 300,000.00 අධික විය. ධර්ම දේශනයන් අවසානයේ දී ශ්‍රාවකයින්ට රාත්‍රි ආහාරය පිළිගැන්වීම සුවිශේෂී වේ. මෙහිදී අනුග්‍රහය ලබා දුන් සියළු දෙනාටම පුණ්‍යානුමෝදනා කරමු. සෑම මසකම උපන් දිනය සමරන සාමාජිකයින් වෙත උපන් දින සුභ පැතුම් පතක් යවන ලදී. ඔවුන්ට ධර්ම දේශනය සඳහා සහභාගී වන ලෙසට දැන්වීමක්ද සිදු කර ඇත

13 අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙනුවෙන් පැවැත්වෙන බෝධි පූජා වන්දනාවට වර්ෂ පහක දී සහභාගි කරවන ලද දෙටු සාමාජික සංඛ්‍යාව 291 කි. 2018 වසරේ සහභාගි කරන ලද මහත්ම මහත්මනියන් 50 ක් පිරිස සහභාගි වු අතර මෙම වැඩසටහන සදහා මෙම වසරේ ප්‍රවාහනය, නවාතැන් හා සියලු ආහාර පාන ආදිය වෙනුවෙන් රුපියල් 81,438.00 ක වියදමක් දරන ලදී.

14 සීල සමාධි වැඩසටහනක් 2018 අගොස්තු මස 12 දින දවස පුරා සමිති ශ්‍රවනාගාරයේදි පවත්වන ලද අතර එදින සිල් සමාදන් වු පිරිස 100 ක් පමණ විය. සිල් සමාදන් කරවීම සිදුකරන ලදි.

15 දෙටු කමිටුවේ සංවිධානත්වයෙන් වෙසක් පුර පසළොස්වක පුන් පොහෝ දින හා පොසොන් පොහෝ දින අප සමිති කාර්යාල පරිශ්‍රය තුල පහන් පූජා පිංකමක් පවත්වන ලදී. මේ සඳහා දෙටු කමිටු සාමාජිකයන්ගෙන් අනුග්‍රහය ලැබිණ.

16 සිංහල අවුරුදු සිරිත් විරිත් සජිවිව දරුවන්ට දැකගත හැකි වන පරිදි ගම්මානයක පරිසරය වලව්ව, ගැමි ගෙදර, නිවස , හා ළිද කෘතිමව සකසා ඒ අනුව චරිතවලට අදාල අයගේ රංගන දායකත්වයෙන් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර පෙන්වා දෙන ලදි. අපගේ පැරණි අවුරුදු සිරිත් විරිත් ගිලිහි යන අවධියක මෙසේ ඉදිරිපත් කිරිම ඉතාමත් කාලෝචිත බවද පෙනේ. ළමා සමාජයේ දරුවන්ගේ නර්තනයන්ද මේ සඳහා ඉදිරිපත් කරන ලදී. මේ සදහා රුපියල් 7,772.00 ක වියදමක් දරන ලදි.

17 සාමාජිකයින් හා ඔවුන්ගේ පවුලේ අයගේ සුහදත්වය වර්ධනය කිරිමේ අරමුණින් මැයිමල් අසිරිය නමින් සැමටම සහභාගි විය හැකි වන පරිදි ක්‍රිඩා වැඩසටහනක් මෙවරද පවත්වන ලදුව මේ සදහා 400 කට අධික සංඛ්‍යාවක් සහභාගි වූවන් ගෙන් ජයග්‍රහණය කල හා ඉදිරිපත් වු සැමට ත්‍යාග පිරිනමන ලදි. මේ සදහා රුපියල් 165,222.00 ක වියදමක් දරා ඇත.

18 ලෝක සකසුරුවම් මාසය යෙදෙන ඔක්තෝබර් මාසය පුරාම සැම දිනකම ගනුදෙනුකරුවන් කීපදෙනෙකු ගෙන්වා පොල්තෙල් පහන දල්වා ගනුදෙනු කොට සංග්‍රහයක් ද සිදු කරන ලදී. මෙහිදී ඔවුන්ව ඉතිරි කිරීම සඳහා පෙළඹවීම අපගේ අභිලාශය වේ.

19 සණස දිවිමග අරමුදල වර්ධනය කිරීමේ අරමුණින් සුභසාධක කමිටුවේ මූලිකත්වයෙන් හා අනෙකුත් කමිටු ඒකාබද්ධව අඛිල සපුමල් නාට්‍ය නිර්මාණ පුළුවන්නං අල්ලගන්න වේදිකා නාට්‍ය ප්‍රදර්ශනය කරන ලදී. ටිකට් පත් ලබාගනිමින් සැම දැක්වූ සහය අගය කරමි. එහිදී දර්ශන වාර 2ක් පවත්වන ලද අතර රු.300 හා 500 බැගින් ප්‍රවේශපත්‍ර නිකුත් කරමින් සමරු කලාපයක්ද පල කරන ලද අතර ආදායම් වලින් වියදම් අඩු කර ඉතිරිය සණස දිවිමග අරමුදලට බැර කරන ලදී.

ස.ණ.ස.
පුවත් කොළඹින්

2019 මැයි කලාපය



## 38 වන වසරට පා තබන
# කරගම්පිටිය කවුඩාන සණස සමිතිය

07 පිටුවෙන්...

### ආර්ථික කටයුතු




**ණය පහසුකම්**

මෙම වර්ෂය තුල පහත සදහන් කාරණා වෙනුවෙන් දී ඇති ණය වටිනාකම රුපියල් කෝටි 23 ක් ඉක්මවයි. ස්ථාවර තැන්පත් මත අත්තිකාරම් ලබා ගැනීමට අමතරව නිකුත් කළ ණය වලින් 71% ක් පමණ ප්‍රාග්ධන වත්කම් වර්ධනය කර ගනිමින් අතිරේක ආදායම් ලබා ගැනීමට යොදා ගන්නා ලදී.

ණය මුදාහැරීම් නියම කර ඇති සීමා යටතේ සාමාන්‍යාධිකාරී වරයා දිනපතා ද මුදල් කමිටුව මගින් සතිපතා ද ණය අනුමත කර මුදා හැරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. දේපල ඇප මත ණය පිළිබදව සභාපතිවරයා සමග මූලික සාකච්ඡා කිරීමෙන් අනතුරුව ණය ඉල්ලුම්කරුවන් කාරක සභාව හමුවට කැදවා සාකච්ඡා කිරීමෙන් පසුව ඉදිරි පියවරයන් ගෙන ඇත

සාමාජික පවුල්වල ජීවන තත්වය උසස් කිරීම සඳහා කල ණය ආයෝජනය සමිතියේ දායකත්වය පිළිබිඹු කරන එක් සාධකයකි. මුළු කාලය තුල ඒකරාශි කරගත් තැන්පත් ප්‍රමාණයන් කෝටි 492 ක් ඉක්මවයි. නිකුත් කර ඇති ණය ප්‍රමාණය කෝටි 223ක් පමණ වේ.

### තැන්පත් හා ණය ආයෝජන වසර පහෙන් පහට තොරතුරු මෙසේය




| කාලය | ලද තැන්පත් | ගෙවූ තැන්පත් | ගෙවූ ණය | අයවූ ණය |
|---|---|---|---|---|
| **1981-1986** | 926,807 | 512,660 | 1,289,817 | 954,694 |
| **1987-1991** | 3,899,315 | 3,536,471 | 6,008,822 | 5,265,175 |
| **1992-1996** | 1,436,200 | 9,745,494 | 22,793,375 | 18,045,346 |
| **1997-2001** | 62,072,492 | 3,588,224 | 58,511,059 | 36,086,186 |
| **2002-2006** | 336,315,800 | 247,159,955 | 329,837,722 | 272,392,673 |
| **2007-2011** | 649,250,862 | 603,627,471 | 467,551,684 | 434,286,699 |
| **2012-2016** | 2,580,046,893 | 2,421,931,617 | 860,550,474 | 745,770,424 |
| **2017-2018** | 1,293,828,398 | 1,258,216,754 | 482,821,242 | 459,937,361 |
| **මුළු එකතුව** | 4,927,776,764 | **4,548,308,646** | **2,229,364,195** | **1,972,738,558** |

### ජයග්‍රහණයන්



කොළඹ දිස්ත්‍රික්කයේ සණස සමිතිවල ගුණාත්මකභාවය හා කාර්යය සාධනය නංවාලීමේ අරමුණින් සීමාසහිත කොළඹ දිස්ත්‍රික් සණස සමිති සංගමය විසින් 2017 වර්ෂය වෙනුවෙන් පවත්වන ලද කාර්යසාධන ඇගයීම් තරගාවලියේද ඉහළම ලකුණු ලබාගත් ඒ ශ්‍රේණියේ සමිතියක් බවට සම්මානයෙන් පුද ලද බව සතුටින් දන්වා සිටිමි.

### නියෝජනයන්

- සමිතියේ සභාපති ඩැනිසන් වීරසූරිය මහතා සණස සම්පත් කළමණාකරණ සමුපකාර ජාතික සංගමයේ සභාපති ලෙස හා කොළඹ දිස්ත්‍රික්කයේ සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති සංගමයේ සභාපතිවරයා ලෙස මෙම වර්ෂයේ දී ද පත් විය. එතුමා 1984 වර්ෂයේ සිටම අඛණ්ඩවම වසර 34 ක් අප සමිතිය නියෝජනය කර ඇත.
- කොළඹ දිස්ත්‍රික් සංගමයේ විශේෂ මහසභා රැස්වීම සඳහා සමිතියේ උප සභාපති එච්. දයාරත්න මහතා නියෝජනය කර ඇත.
- 2018 වර්ෂයේදි ගල්කිස්ස පර්ෂදයේ ගරු සභාපති ලෙස ප්‍රනිත් උක්වත්ත මහතා පත්විය.
- 2018 වර්ෂයේදී ද කළාපිය කාන්තා උප සභාපතිනි ලෙස ගිතා චාන්දනි ප්‍රනාන්දු මහත්මිය පත්වූවාය.
- ගරු අධ්‍යක්ෂකවරුන් වන ගාමිණි ආර්. රාජපක්ෂ, ප්‍රනීත් උක්වත්ත හා නවීන් මලීෂ යන මහත්වරුන් පර්ෂද කමිටුව නියෝජනය කරන ලදී.



අප සමිතියේ 37 වන සංවත්සර මහසභා රැස්වීම 2019 මාර්තු මස 31 වන ඉරු දින දෙහිවල ඇස් ද ඇස් ජයසිංහ සමරු රගහලේදි සමුපකාර නායකයින්ගේ සහභාගිත්වයෙන් සාර්ථකව පවත්වන ලද අතර එහිදි නව වර්ෂය සදහා නිළධාරින් පත්කර ගන්නා ලද අතර සියලු කාරණා ඉටු කර ගැනීමේ දී ආරම්භයේ සිටම නායකත්වය දෙමින් මග පෙන්වන සභාපතිතුමා සමිතියට යෝධ බල ශක්තියකි. දෙවන පෙළ නායකත්වයට හැඩ ගැසෙන අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලැබෙන සහයෝගයත් දායකත්වයත් මා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට මහත් ශක්තියකි. සමිතිය ගමටම මහත් සෙතක් සලසන තැනට පත්කරමින් එහි අනාගත වගකීම් නොඅඩුවම ඉටුකිරීම සදහා ස්ථාවරත්වයක් ගොඩ නැගීමට අපට හැකිවී ඇත. මෙම සියලු කටයුතු වලදී මහත් කැපවීමකින්, මෙන්ම සියලු දෙනාගේ සතුටට හේතුවන පරිදි සේවාවන් උපරිමයෙන් සැලසීමට හැකි වූයේ මගේ සහෝදර කාර්ය මණ්ඩලය මට මහත් ශක්තියක් මෙන්ම ධෛර්යයක් ලබා දුන් බැවිනි.



කාර්යසාධන ඇගයීම් සම්මාන උළෙලදී ඒ ශ්‍රේණියේ ප්‍රථම ස්ථානයට හිමි සම්මානය ලබා ගනිමින්



**අජිත් ප්‍රේමලාල්**
**සාමාන්‍යාධිකාරී/ලේකම්**